# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2003/25 - 2017 ජනවාරි මස 25 වැනි බදාදා - 2017.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 5/1/2/20.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2013/PC/555.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තු කෝරලේ, මැද පත්තු බටහිර සුළු කොට්ඨාසයේ, කඳානේ ගෙදර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2015.12.17 දිනැති අවසාන ගම් පිඹුර 294, පත්‍ර අංක 07, අතිරේක අංක 9, දරන පිඹුරේ පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.1871 ක් වූ පහත විස්තර කෙරෙන බිම් කැබලි 02 ක.

**01. කැබලි අංක 52**
ඉඩමේ නම: කෝන්ගහමුල හේන *නොහොත්* කහටගහමුල හේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 30 - 40 ක් වයසැති පොල් ගස් 112ක් ද අවුරුදු 1 - 5 ක් වයසැති පොල් ගස් 108ක් ද කොස් ගස් 9 ක් ද,තේක්ක ගස් 32ක් ද, සූරියමාර ගස් 1ක් ද, හල්මිල්ල ගස් 1ක් ද, ස්ථිර ගොඩනැගිලි 2ක් ද, අත්තිවාරමක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ද ඇත; හිමිකම් කියන්නා: මිරිස්සගේ සුජිත් ස්ටැන්ලි ප්‍රනාන්දු, අංක 178 සී, බොරැල්ල පාර, වෙන්නප්පුව; ප්‍රමාණය: හෙක්. 1.1442.

02. කැබලි අංක 53
ඉඩමේ නම: කෝන්ගහමුල හේන *නොහොත්* කහටගහමුල හේන; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: මිරිස්සගේ සුජිත් ස්ටැන්ලි ප්‍රනාන්දු, අංක 178 සී, බොරැල්ල පාර, වෙන්නප්පුව, ඩබ්ලිව්. ඒ. සිසිර කුමාර විජේසිංහ, කඳානේගෙදර, වඩුමුන්නේගෙදර, ඩබ්ලිව්. ඒ. සරත් කුමාර විජේසිංහ, කඳානේ ගෙදර, වඩුමුන්නේගෙදර; ප්‍රමාණය: හෙක්. 0.0429.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 මාර්තු මස 22 වැනි දින පෙ.ව. 10.30 ට පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2017 මාර්තු මස 15 වැනි දිනට හෝ මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2017 ජනවාරි මස 18 වැනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 384


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24990—17 (2017/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.